ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
**පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව**

# ලංසු ආරාධනය (IFB)

## ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිලියන පහළොවක් ප්‍රසම්පාදනය

## IFB අංකය : DRP/ACC/07/33/2025

01. සභාපති, ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය විසින් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙනුවෙන් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිලියන පහළොවක් (1,5000,000) ප්‍රසම්පාදනය කිරීමට යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

02. ලංසු කැඳවීම, තනි අදියර, ද්විත්ව කවර පටිපාටිය අනුව ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමය හරහා සිදු කෙරෙනු ඇත. (ICB)

03. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා යෝග්‍යතාව ලැබීමට ලංසුකරුවා පහත සඳහන් අවම සුදුසුකම් සැපිරිය යුතු වෙයි. මෙම අමතර විස්තර ලංසු ලේඛනයන් තුළ සපයා ඇත.

(a) ලංසුකරු, ලංසු භාරගැනීම අවසන් වන දිනට වසර පහක (05) ට වැඩි කාලයක් අදාළ රටේ ලියාපදිංචි සමාගමක් විය යුතුය.

(b) මෙම ප්‍රසම්පාදනයට ලංසු ඉදිරිපත් කරන ලංසුකරු (තනි ලංසුකරුවෙකු නම්) හෝ බද්ධ ව්‍යාපාරයක් නම් එහි සියලු සාමාජිකයන් ISO 9001:2015 (තත්ත්ව කළමනාකරණ පද්ධතිය) සහතිකය ලබා තිබිය යුතුය.

(c) මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු ඉදිරිපත් කරන ලංසුකරු (තනි ලංසුකරුවෙකු නම්) හෝ බද්ධ ව්‍යාපාරයක් නම් එහි ප්‍රධාන ලංසුකරු 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ ලියාපදිංචි වී සිටිය යුතුය.

(d) මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු ඉදිරිපත් කරන ලංසුකරු (තනි ලංසුකරුවෙක් නම්) හෝ ප්‍රමුඛ ලංසුකරු (බද්ධ ව්‍යාපාරයක් නම්) විසින්, පසුගිය වසර තුන (2023-2025) තුළ, රජයේ ආයතන, ව්‍යවස්ථාපිත ආයතන, හෝ රාජ්‍ය අනුමත ආයතනවල අධිකාරිය යටතේ මෙම ප්‍රසම්පාදනයට අදාළ පූර්ව-මුද්‍රිත කාඩ්පත් නිෂ්පාදනය කිරීමට ප්‍රකාශිත නිෂ්පාදන ස්ථානය / කර්මාන්තශාලාව / ඒකකය මගින් උපරිම වශයෙන් වෙනම ව්‍යාපෘති තුනක් (03) හරහා, ISO/IEC 7810, ISO/IEC 10373 සහ ISO/IEC 24789 ප්‍රමිතීන්ට අනුකූල වූ, 100% පොලිකාබනේට් හැඳුනුම්පත් (මෙම ප්‍රසම්පාදනයේ ඉල්ලා ඇති ආරක්ෂක සහ අනෙකුත් ලක්ෂණ සහිතව) මිලියන පහළොවකට (15) නොඅඩු සමස්ත ප්‍රමාණයක් නිෂ්පාදනය කර සහ සැපයීම සිදු කර තිබිය යුතුය.

(e) මෙම ප්‍රසම්පාදනය සඳහා පෙර මුද්‍රිත හැඳුනුම්පත් හෝ එහි ව්‍යුහාත්මක සංරචක (පොලිකාබනේට් කාඩ්පත, ආරක්ෂක ලක්ෂණ) නිෂ්පාදනයට සම්බන්ධ වන බවට ප්‍රකාශිත ලංසුකරු (තනි ලංසුකරුවෙක් නම්) හෝ ප්‍රධාන ලංසුකරු (හවුල් ව්‍යාපාරයක් නම්) සහ සියලුම නිෂ්පාදකයන් (උප කොන්ත්‍රාත්කරුවන් ද ඇතුළුව) ISO 9001:2015 (ගුණාත්මක කළමනාකරණ පද්ධති) සහ ISO 14298 - රජයේ මට්ටම / මහ බැංකු මට්ටම (ග්‍රැෆික් තාක්ෂණය - ආරක්ෂක මුද්‍රණ ක්‍රියාවලි කළමනාකරණය) සහතිකලත් විය යුතුය. මෙයට මෙම ප්‍රසම්පාදනය සඳහා පූර්ව-මුද්‍රිත කාඩ්පත් නිෂ්පාදනය කිරීමට ප්‍රකාශිත නිෂ්පාදන ස්ථාන / කර්මාන්තශාලා / ඒකක ද ඇතුළත් වේ. ලංසුකරුගේ / නිෂ්පාදක(යන්)ගේ නම්, අදාළ විෂය පථය සහිත Intergraph සහතිකයෙහි සඳහන් නම් හා සමාන විය යුතුය.

(f) මෙම ප්‍රසම්පාදනයට ලංසු ඉදිරිපත් කරන ලංසුකරුවා (තනි ලංසුකරුවෙකු නම්) පසුගිය වසර තුන (03) තුළ (2021/22-223/24) අවම වශයෙන් ඇ.ඩො මිලියන 25/ යූරෝ මිලියන 20 ක හෝ ඊට ඉහළ සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් තිබිය යුතු අතර බද්ධ ව්‍යාපාරයකදී නම් එක් එක් හවුල්කරුවාට අවම වශයෙන් ඇ.ඩො. මිලියන 6 ක/ යූරෝ මිලියන 5 ක වාර්ෂික පිරිවැටුමක් තිබිය යුතුය.

(g) මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු ඉදිරිපත් කරන ලංසුකරු (තනි ලංසුකරුවෙක් නම්) විසින්, මෙම ප්‍රසම්පාදනය සඳහා අවම වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 15ක් හෝ යුරෝ මිලියන 12ක ශුද්ධ ද්‍රවශීල වත්කම් (ජංගම වත්කම් - තොග - ජංගම වගකීම්) හෝ ණය පහසුකම් සතු විය යුතුය. හවුල් ව්‍යාපාරයකදී, එක් එක් හවුල්කරු සඳහා අවම වශයෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 3ක හෝ යුරෝ මිලියන 2.5ක වත්කම් තිබිය යුතුය.

04. උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට, සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා ප්‍රධාන ගණකාධිකාරී, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, සුහුරුපාය, බත්තරමුල්ල වෙතින් **+94 115226172** ඔස්සේ හෝ **drpprocurement@gmail.com** විද්‍යුත් ලිපිනය ඔස්සේ වැඩිදුර තොරතුරු ලබාගත හැකි අතර **2025 සැප්තැම්බර් 22** සිට **2025 ඔක්තෝබර් 31** දක්වා **පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** දක්වා ගිණුම් අංශය, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල, සී කොටස, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර මාවත, බත්තරමුල්ල වෙතින් හෝ **www.mode.gov.lk** සහ **www.drp.gov.lk** යන නිල වෙබ් අඩවිවලින් නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කළ හැකිය.

05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2025 සැප්තැම්බර් 22** සිට **2025 ඔක්තෝබර් 31** දක්වා දක්වා වැඩ කරන දිනවල **පෙ.ව. 9.00** සිට **ප.ව. 3.00** අතර කාලය තුළ නැවත නොගෙවනු ලබන ශ්‍රී ලංකා **රු. 200,000.00** ක ගාස්තුවක් ගෙවා ගණකාධිකාරී, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය ලබා ගත හැකිය. ගෙවීමේ ක්‍රමය වන්නේ මුදල් මගින් ගෙවීමයි.

06. **2025 ඔක්තෝබර් 13** දින **ප.ව. 2.00** ට (දේශීය වේලාව) ශ්‍රවණාගාරය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 13 වන මහල, සුහුරුපාය ගොඩනැගිලි, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල හිදී පූර්ව ලංසු රැස්වීමක් පැවැත්වෙනු ඇත. උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන් පූර්ව ලංසු රැස්වීමට සහභාගි විය යුතුය. ලංසුකරුවන්ට මෙම හමුව සඳහා අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ වීමටද හැකියාව ඇති අතර, ඒ සඳහා අන්තර්ජාල සම්මන්ත්‍රණ පහසුකමෙහි සබැඳිය ලබා ගැනීමට ඊමේල් පණිවිඩයක් මගින් ඉල්ලීම් කළ යුතුය.

07. ලංසු **2026 අප්‍රේල් 27** දක්වා වලංගු විය යුතුය. සියලුම ලංසු සමග, **රු. 50,000,000.00** ක හෝ ඊට සමාන පහසුවෙන් හුවමාරු කළ හැකි මුදලකින් යුතු ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. මෙම ලංසු ඇපකරය **2026 ජුනි 22** දක්වා වලංගු වන බැංකු ඇපකරයක් විය යුතු අතර, එය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලත් වාණිජ බැංකුවක් විසින් හෝ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ බැංකුවක් විසින් සහතික කරන ලද විදේශීය බැංකුවක් විසින්, ලංසු ලේඛනවල දක්වා ඇති ආකෘතියට අනුව නිකුත් කර තිබිය යුතුය. යොමු කරන ලංසු, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, 12 වන මහල C පර්යන්තය, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ලිපිනය වෙත **2025 නොවැම්බර් 03 ප.ව. 2.00** (දේශීය වේලාව)ට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තාක්ෂණික ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.


**සභාපති,**
**ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව,**
**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය,**
**11 මහල, 1101, One Galle Face,**
**අංක 1A, මැද පාර, ගාලු මුවදොර, කොළඹ 02,**
**ශ්‍රී ලංකාව.**


**2025.09.22**

SELACINE